**කොවිඩ් 19 - සති පාසල**

**2021 - තුන්වන වාරය - අටවන සතිය**

**10 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව**

## 6 පාඩම - ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය, ගැටලු හා ප්‍රවණතා

**මෝටර් රථ එකලස් කිරීම හා බෝට්ටු නිෂ්පාදනය (පෙළ පොත පිටු අංක 126-128)**

- ශ්‍රී ලංකාව තුළ මෑත කාලීනව ආරම්භ වූ කර්මාන්ත අතර වර්ධනීය ලක්ෂණ පෙන්නුම් කරන කර්මාන්තයක් ලෙස මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය හැඳින්විය හැකිය.
- 2001 වර්ෂයේ පොල්ගහවෙල ප්‍රදේශයේ ආරම්භ වූ මයික්‍රෝ මෝටර් රථ කර්මාන්තයද ආනයනික මෝටර් රථ කොටස් එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස ආරම්භ වූවකි.
- එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස දේශීය කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ශක්තිමත් වීම, විවිධ මාදිලියේ මෝටර් රථ එකලස් කිරීම, මෝටර් රථ සඳහා නව තාක්ෂණික ශිල්ප ක්‍රම හා විවිධ උපාංග යොදා ගැනීම මෙම කර්මාන්තයෙහි දක්නට ඇති ප්‍රවණතා වේ.
- මෙරට කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ බෝට්ටු සඳහා දේශීය ඉල්ලුම වැඩි වීමත්, සංචාරක අංශයේ සිදු වූ වර්ධනයත් නිසා බෝට්ටු නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස දියුණු විය.
- දැව බෝට්ටු නිෂ්පාදනය පිළිබඳ පාරම්පරික අත්දැකීම් නිසා උසස් වර්ගයේ බෝට්ටු නිෂ්පාදනයට ශ්‍රී ලංකාව සමත් වී තිබේ.
- මෙරට පෞද්ගලික ව්‍යවසායකයින් රැසක් දේශීය මෙන්ම විදේශීය වෙළඳපළ සඳහාද බෝට්ටු නිෂ්පාදනය කරනු ලැබේ.
- ඉන්දියාව, මාලදිවයින, සිංගප්පූරුව, නෝර්වේ, දකුණු කොරියාව, සීසෙල්ස් දූපත් සඳහා මෙරට බෝට්ටු අපනයනය කරන අතර ශ්‍රී ලංකාවේ බෝට්ටුවලට ඇති ඉල්ලුම ක්‍රමිකව ඉහළ ගොස් ඇත.

**ක්‍රියාකාරකම**

01. දේශීය වශයෙන් මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය ආරම්භ වීමට හේතු දෙකක් ලියන්න.
02. ශ්‍රී ලංකාවේ මෝටර් රථ එකලස් කිරීමේ කර්මන්තායතනය හඳුන්වන නම කුමක්ද?
    එය පිහිටි ප්‍රදේශය හා පිහිට වූ වර්ෂය ලියන්න.
03. මෝටර් රථ කර්මාන්තය තුළ දක්නට ඇති ගැටලු හා ප්‍රවණතා තුන බැගින් ලියන්න.
04. මෙරට කුඩා හා මධ්‍ය පරිමාණයේ බෝට්ටු නිෂ්පාදනයට යොමු වීමට හේතු මොනවාද?
05. ශ්‍රී ලංකාවෙන් බෝට්ටු අපනයනය කරන රටවල් හයක් ලියන්න.
06. මෙරට නිෂ්පාදනය කරන බෝට්ටු වර්ග පහක් නම් කරන්න.
07. ශ්‍රී ලංකාවේ බෝට්ටු නිෂ්පාදන කර්මාන්තය තුළ දක්නට ඇති ගැටලු හා ප්‍රවණතා ලියන්න.